සිනුවර හැසුන

සිඩ්නි සිට ලියමි

පසුගිය ද නිවාඩුවක් සඳහා ලංකාවට ගිය මට අපූරු අත්දැකීමකට මුහුණ දෙන්නට සිදුවිය. මා පින්නවල අලි අනාථාගාරය නරඹා ආපසු රථගාල දෙසට යමින් සිටියෙමි. මග අසල වූ කඩයක අපූරු අලි කැටයමක් දුටු මම එහි මදක් නැවතී එය පරීක්ෂා කර බලා එහි සිටි වෙළඳ තරුණියගෙන් කැටයමේ මිළ විමසුවෙමි.

මගේ වදන් ඇසූ එහි සිටි තවත් යුවතියක් පුදුමයෙන් මෙන් මා දෙස බලා සිටියාය.

පසුව ඇය "අනේ මේ අපූරුවට සිංහල කතා කරන්නේ! මහත්තයා සිංහල ද?" කියා මගෙන් විමසූවේ මා තක්බීර් කරමිනි.

"ඇයි මම දෙමල කියලද හිතුවේ?" මම සැකයෙන් ඇසුවෙමි.

"නෑ! මම හිතුවේ ඉන්දියාවෙන් ආපු සංචාරකයෙක් කියලයි"

"ඇයි එහෙම හිතුනේ?"

"නෑ, මට හිකන් හිතුනා!" ඇය ලැජ්ජාවෙන් කීවාය. ඒ යුවතිය පින්නවල රථ ගාලේ ටිකට් පත් නිකුත් කරන්නියයි.

මෙය හුදෙකලා, අහඹු සිද්ධියක් ලෙස සලකා මගේ මතකයෙන් බැහැර කිරීමටත් පෙර පසුද ශ්‍රී දළදා මාළිගාවට අනුබද්ධ කෞතුකාගාරයේ දී ද මෙවැනි සිද්ධියක් සිදුවිය.

මා එහි ඇතුළු වී ටික වේලාවකින් කෞතුකාගාර සේවකයෙක් මා වෙත පැමිණ එහි වූ ඡායාරූප කිහිපයක් පෙන්වමින් "සෑර්, ඇල් ටී ටී ටෙරොරිස් බොම් ද ටැම්පල්" යනාදී වශයෙන් කියවන්නට විය.

"මං සිංහල" යැයි මම හෙමින් කොඳුරා කීවෙමි. "සමාවෙන්න සර්, හැටියෙන් හිතුනෙ සර් පිටරට කෙනෙක් කියලයි" පැවසූ ඔහු පසෙකට විය.

එදිනම බහිරවකන්දේ බුදු පිළිමය නරඹන්නට ගිය විට ද මා මෝටර් රථයෙන් බහිනවාත් සමගම, "සෑර්, යූ කැන් කීප් ෂූස් හියර්" යැයි මිනිසෙක් පවසනවා ඇසුනි. ඒ ද මා විදේශිකයෙක් යැයි සිතාය.

මේ සියළු සිදුවීම් එද මගේ සිනාවට හේතු වූවද, පසුව මා දැඩි කල්පනාවකටත්, අවසානයේ කණගාටුවකටත් යොමු කළේය.

ඕස්ට්‍රේලියාවේ විප්‍රවාසී ජීවිත ගත කරන අපට අද ලංකාවට ගිය විට, විශ්වාසයෙන් යුතුව මෝටර් රථයක් ධාවනයට යළිත් නුරු වීම සඳහා දිනක් දෙකක් පමණ ගතවේ. ඉස්සර වාගේ මඳුරුවන්, මැස්සන් සමග සාමකාමී සහජීවනය දැන් අපට නුපුරුදු ය. දහඩිය දැමීම නුහුරුය. ගම්බඳ කඩවල මුදලාලි ලා පාන් හෝ ආප්ප හෝ වැනි කෑම වර්ග අතින් අල්ලා සපයනු දුටු විට අප්පිරියා ඇතිවේ. කඩවල් වලින් වතුර වීදුරුවක් නොබොමු. බෝතල් ගත ජලය ම පානය කරමු.

අපේ දෙවන පරම්පරාවට මඳුරු විසෙන් සමේ පළු මතුවේ. ඔවුන් ට ලංකාවේ නගර බඳ කානු ගඳට ඔක්කාරය සෑදේ. ඕස්ට්‍රේලියාවට පැමිණ වසර පහළොවක්වත් ගෙවී යන්නට පෙර ම අප ගතින් මෙන්ම සිතිනුත්, හැසිරීමෙන් මෙන්ම චින්තනයෙනුත්, විදේශකයින් බවට පත් වී ඇත් ද? අප පරිවර්තනකට ලක්වෙමින් තිබේ ද? අපේ දෙවන පරම්පරාව සුළු පරිනාමයකට ලක්වෙමින් තිබේ ද?

සිත් ගන්නා ප්‍රශ්ණ කිහිපයකි. කෙසේ වෙතත් එකක් පැහැදිලිය. එලෙස පරිවර්තනයක් හෝ පරිනාමයක් හෝ සිදුවෙමින් පවතී නම් එහි අද සැබෑ ප්‍රතිඵලය, මා පසුගිය වසර ගණනාවක සිට දිනපතාම වාගේ www.lankaenews.com/Sinhala, www.lakbima.com, www.divaina.com යනාදිය අවුන්සය බැගින් ගෙන පත අට එකට සිඳ සිනි, මී පැණි දමා උදේ හවා කෂායක් සේ නොබිව්වා නම් මිටත් වඩා දරුණු වෙන්නට ඉඩ තිබුණි.

සන්නස වැනි අපේම ප්‍රකාශනයක් මාස්පතා කියවීමටත්, හැකි අයුරින් එයට දායක වීමටත් ලැබීම ද මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතුමය.

සිනුවර ආරච්චිල <sinuwara.arachchila@gmail.com>

ගී රස ගංගා

මෙහෙළ්ටන් පෙම් රුවන්
මියැසි ලොව මිණ රුවන් "
(හෙළයේ ගාන්ධරවයාණෝ සහ දරුවෝ " පිට 134)

හෙළයේ ජ්‍යෙෂ්ඨතම ගේය පද නිබන්ධකවරයාණ වන කලාශූරී අරිසෙන් අනුබුදුවන් විසින් හෙළයේ ජ්‍යෙෂ්ඨතම ගාන්ධර්වයාණන් වන කලාශූරී ෂෙල්ටන් ප්‍රේමරත්නයන් වෙනුවෙන් පබඳුණු පද පෙළක දෙපදයකි ඒ.

වසර 60 කට අධික කාලයත් තුළ සිනමාව, වේදිකාව රූපවාහිනිය වැනි මාධ්‍ය සඳහා කලා වූ මියැසි නිර්මාණ දයකත්වය සහ උත්තර භාරතීය අපරදිග ජන හා වැදි සංගීතය ඇසුරින් කලා වූ පර්යේෂණාත්මක මෙහෙවර වෙනුවෙන් වර්ෂ 2009 දී කැළණිය සෞන්දර්ය විශ්ව විද්‍යාලය වෙතින් ජීවිත කාලයක මෙහෙවර සඳහා පිදෙන "දර්ශන ශූරී" (HONORIS COUSA) ගරු නාමයෙන් යුත් ආචාර්ය උපාධියෙන් පිදුම් ලැබුවේ එතුමාණෝ.

ඒ අභිමානවත් සංගීතවේදියාණන්ගේ නිරහංකාර සිනා රැල්ලක් සිහිල විඳීමට වාසනාවන්තයින් නොවීමු ද මෙල්බර්න් පුරවර වෙසෙන අපි ? එතුමාණන් ගේ මියුරු මියැසි රටා කැටිකොටගත් ස්වර පෙළක පහස සපිඹිව විඳිනට භාග්‍යවන්තයින් නොවීමු ද අපි ? ඒ මතු නොව එකී ශිල්පය හැදෑරීමට ද පුණ්‍යවන්ත වූ පිරිසක් වේය මෙනුවර.

කලක් තිස්සේ ප්‍රේමරත්න අසපුවෙහි මියැසි ශිප් ප්‍රගුණ කලා වූ එවන් එක් යොවුන් ශිෂ්‍යාවක වන කාංචනා සඳමාලිය පිරිවරාගත් තවත් එවන් සිසු හා සහෘද පිරිසකගේ සැදි පිරිවර මෙනුවර තවත් එක් නැවුම් ප්‍රයත්නයක් සඳහා ලගි ලගියේ සැරසෙයි.

ෂෙල්ටන් ප්‍රේමරත්නයන්ගේ අතිමියුරු තනු රැගත් ප්‍රවීණයන් ගායනා කල ගී පෙළහර හා නව නිර්මාණ පෙළක් සමගින් ගීතවත් වන්නීය සඳමාලිය. ඒ "ගී රස ගංගා" ගී පෙළහර සමගිනි. රස ගංගාවෙහි පුහුණු මියැසි තරංග නැංවුණ එක් සැදෑවක "සන්නස" මුහුවිය ඒ හා මෙලෙසින්.

"අනේ මල්ලි, මා ගැන නෙවෙයි, මේ දරුවෝ ටික ගැන ලියන්න... ප්‍රේමරත්න ගේ සිනහව නිතමාගී බවින් ඉතිරෙයි. එතුමන්ගේ ඇතැඟිලි "හාර්මෝනියම්" සර පුපරුවව මත තවමත් පොපියයි. ඒ අය ගැන ඔබතුමාම යමක් කිව්වනං නේද හොඳ ? හොඳයි මං කාංචනා දුවගෙන් පටන් ගන්නම්කෝ. ඉඩ තියෙන හැටියට අතික් අය ගැනත් බලන්න.

දැන් කාංචනාට මගෙන් සංගීතය ඉගෙන ගන්න වසර දෙකක් විතර ඉඩ ලැබුණා. ඉතින් එයාගේ උපන් හැකියාවයි. කඳින් උදව් කරනු අයගේ ආභාෂයයි ඔක්කොම එකතුවෙලා තමයි මේ තත්වයට ඇවිත් තියෙන්නේ. විවිධ වර්ගවල ගීත කියා දුන්නම ඉතාම පහසුවෙන් කාංචනා ග්‍රහණය කරගත්තා. ඒ කියන්නේ සිංහල, දෙමළ, හින්දි, ශාස්ත්‍රීය ගීත වගේ රටේ හැමදෙනාම නියේජනය වෙන විදියේ ගීත. ඉතින් ඒ හැම දෙයක්ම එකතු කරලයි අපි මේ ප්‍රසංගය කරන්නේ. ඇත්තටම අවුරුදු දෙකක් වගේ කෙටි කාලයකදී මේ වාගේ මහා පරිමාණයේ වැඩකට අවශ්‍ය කරන දේ ග්‍රහණය කරගන්න කාංචනාට ලැබුණේ දෙමව්පියන්ගේ තියෙන උනන්දුවත් නිසායි. කාංචනා සෑම විරරත්න සහ එම මැතිණියගේ දෙවු දියණියයි.

"සංගීතය නොපෙනෙන විෂයයක් නිසා ඒ පිළිබඳව මතිමතාන්තර ප්‍රකාශ කිරීම ටිකක් අපහසුය. මට කියන්න තියෙන්නේ මේක නරඹලාම විඳින්න ඕන. මෙල්බර්න්වල මෙතෙක් මේ වාගේ ප්‍රසංගයක් කෙරිලා නෑ අතිත් සංගීතඥයෝත් ඇවිත් බොහොම අලංකාර දේවල් කරලා තියෙනවා. නමුත් නවතායකින් අලුත් අරුතයකින් සංගීතාවලිය දිග හැරෙන අවස්ථාවක් මේක."

අපිට එකතු වෙන පිරිස ගැනත් කියන්නම ඕන. ප්‍රසංගය පණගන්වන්න ඒ අය ගාව ඉන්ධන සෑහෙන ප්‍රමාණයක් තියෙනවා. ඒක ලොකු දෙයක්. මේක සාමූහික කලාවක්නෙ. එක්කෙනෙක් විතරක් ඉස්මතුවෙන කලාවක් නෙවෙයිනේ. මේ හැම දෙනාගෙම අතීතයේ ඉඳන් තියෙන පුරුද්ද අපට හරි ප්‍රයෝජනවත් වෙනවා. කිව්ව ගමන් වැඩේ ඉෂ්ට වෙනවා. දැන් ඉතින් මේ අයත් සිඩ්නිවල ඉඳන් එන ගිරාන්, රවි, රුක්මනි කුළුතිලකලාත් මගේ ගුරුහරුකම් ගත්ත මගේම ගෝලයෝ වෙලා...."

ප්‍රේමරත්නයෝ සිය අදහස් දැක්වූහ. ප්‍රසංගයේ වාද්‍ය වෘන්දය හසුරුවන අගා ප්‍රේමරත්න ප්‍රේමරත්නයන්ගේ පුත්‍ර රත්නය වන අතර තබ්ලා වාද්‍ය ශිල්පී රෝහිත උඩුවෙල එතුමාණන්ගේ ශිෂ්‍යයෙකි. ජානක බානගල, රෝහණ කරුණාරත්න, සරත් විතානරච්චි, සුනිල් කුමාරසිංහ , නෙළුම් ලියනගේ, චම්රි පෙරේරා හා නිරාන් පහළවත්ත ඇතුලත් වන ගායන වෘන්දයට එක්වන සමන්ත විරරත්න කාංචනාගේ වැඩිමහල් සොහොයුරායි.

"මම වයස අවේදී විතර ලංකාවේ රෝහණ විරසිංහ මහත්මයාගේ කලා භූමි ආයතනයේ ටික කාලයක් ඉගෙන ගන්නා ... " කාංචනා සඳමාලි සිය ගායනීය හඬ අවදි කලාය. "ඊට පස්සේ මම මෙහොට ආවා. ඉස්සරවෙලා ම ප්‍රභාති මිල්ටන් හැන්දගේ වැඩ සටහනක "ආදරේ ඇයි පොඩි හඳ මාමේ" කියන ගීතය ගායනා කළා. එතකොට මට වයස අවුරුදු දෙළහක් විතර ඇති. දේවිකා රූපසිංහ හැන්දගේ රේඩියෝ වැඩසටහන් වලටත් මම ගීත ගායනා කළා. ඒ ඇරුණම මෙහේ තිබුණ එක එක ප්‍රසංගවල එහෙම ගායනා ඉදිරිපත් කළා. ඒ වුනාට ෂෙල්ටන් ප්‍රේමරත්න මහත්මයා මුණගැහුණාට පස්සේ තමා සංගීතය ක්‍රමවත්ව ඉගෙන ගත්තේ. ඇත්තටම ඒ දේට මාව යොමු කළේ තාත්තා. ඒක මට ලැබුණ ලොකු වාසනාවක්. ගුරුතුමා වගේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් මේ වගේ ප්‍රසංගයක් කරන්න මාව තෝරගෙන මා ගැන විශ්වාසය තියපු එක මට හිතාගන්න අමාරුයි "

"ගුරුතුමා කියා දෙන ක්‍රමය නිසා මට ඒ දේවල් ග්‍රහණය කරගන්න පහසු වුණා. ඒ බොහෝ දේවල් එතුමන්ගෙන්මයි ආවේ. ප්‍රසංගය ගැන හිතනකොට මට හිතෙනවා ඒක දැවන්න ප්‍රසංගයක් වේවි කියලා. හැම විදියෙම දේවල් ඒකට ඇතුලත් වෙලා තියෙනවා " අගා අයියා ගේ සහයත් හරි වැදගත් "

ප්‍රසංගයේ සංගීතය මෙහෙයවන අගා ප්‍රේමරත්න දක්ෂ ගායකයෙකු ද වන අතර , සංගීත නිර්මාපකයෙකු ශබ්ද පරිපාලනය පිළිබඳ ඉංජිනේරුවකු ද වෙයි. ඉන්දියාවේ වෙන්නායි "කලා ක්ෂේත්‍රය හි අධ්‍යාපනය ලැබීමට ඔහුට පෙරමග පෙන්වුයේ සිය පියාණන්ගේ අත්පොත් තබමින් ප්‍රගුණ කළ ශිල්පයයි. වසර 2004 දී "අරිසෙන් අනුබුදු මියුරැසි" වෙනුවෙන් සංගීත සම අධ්‍යක්ෂනයට එක්වීම ඔහුගේ නිර්මාණ දිවියේ වැදගත් අවස්ථාවකි.

"මට තාත්තා වගේම අම්මාත් ගොඩාක් උදව් වෙනවා. මගේ දරුවන් දෙන්නා තවම කුඩයි. ඒ අය ගැන බලාගෙන මට මේ කටයුතු වලට ඉඩ ලබාදෙන්න අම්මා. ඒ වගේම මේ හැම දේටම මාව උනන්දු කරවලා සහාය දෙන්නේ මගේ සැමියා, මුතුමල් පෙරේරා යි මගේ අයියායි. " කාංචනා අන් අයගේ පුහුණුවීම් සමග එක්වීමට සමුගත්තාය. මෙල්බර් නුවරට සංක්‍රමණික අපගේ දරුවන් වන දෙවන පරපුරෙන්. මුලින්ම ගී එකතුවක් එළිදැක්වුයේ ඇයගේ සොහොයුරා වන සමන්ත විරරත්නයි. ඔහුගේ සියළු සංගීතමය කටයුතු වෙනුවෙන් දයක වීමට වරම් ලැබුවාය ඇය.

"ඒ දවස්වල කරුණාරත්න අබේසේකර අනුස්මරණ රූපවාහිනී වැඩසටහනක ගීත ගයන්න කාංචනාට ඉඩ ලැබුණා. ඊට පෙරත් ගුවන් විදුලියේ ළමා මණ්ඩලයටත් සහභාගී වුණා. " කාංචනාගේ මව ඇයගේ මතකයෙන් ගිලිහුණ දේ පිළිබඳව සිහිපත් කළාය.

කාංචනා සඳමාලිය පිළිබඳව දිගු කාලීන මතකයන් අවදි කරවන්නට හඬ අවදි කලේ මෙල්බර්න් නුවර අප අතර සිටිනා පුරෝගාමී ගායනා ශිල්පියෙකු වන රෝහණ කරුණාරත්නයන්. "අපි කාංචනා ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕන. මොකද අපි ඇයව හඳුනන්නේ 1992 විතර ඉඳන්. අපි ඇයගේ ගායන කුසලතාව හඳුනා ගත්තේ 1993 දියි. විශාරද දීපිකා ප්‍රියදර්ශනීගේ "පිතු සෙනෙහේ " කියන ගීතය ඇය ඉතාමත් හොඳට ගායනා කළා. තනියම වේදිකාවක ඉඳගෙන තමන්ගේ ප්‍රසංගයක් කරන්න වුනත් ඇය දක්ෂයි කියලා මට හිතුණේ එදයි.

ඊට පස්සේ දිගින් දිගටම ඇය වේදිකාවල දුටුවා. මට මතකයේ හැටියට නාට්‍යවලත් රඟපාලා තියෙනවා. ප්‍රමාද වෙලා හරි මේ වගේ ප්‍රසංගයක් පැවැත්වීමට යෙදුන එක පිළිබඳව මම සතුටුවෙනවා"

"ඒ වගේම ෂෙල්ටන් ප්‍රේමරත්නයන් මෙල්බර්න් නුවර අප අතර සිටිමත් මහත් භාග්‍යක් කොට මා සලකනවා. අපට ඒ වගේ විද්වතුන්ගෙන් ලබාගෙන්න තියෙන දේ බොහෝයි. සංගීතය අතින් විතරක් නෙවෙයි සාමාන්‍ය විදියට කතා කරමින් සිටියත් විශාල දැනුමක් ලැබෙන්නේ. ඒ විදියේ සංගීතවේදියෙකුගෙන් ආශිර්වාදය ලබාගෙන සංගීත දැනුම ලබාගෙන ක්‍රමවත්ම ලබන මේ පුහුණුව කාංචනාට විතරක් නෙවෙයි. සහාය ගායනා කරන අපටත් හොඳ අභ්‍යාසයක් " රෝහණ අදහස දැක්වීය.

විවිධාකාර වූ ගී එකතුවක් වන "ගී රස ගංගා" ප්‍රසංගය ප්‍රේමරත්න ආචාර්යවරයාණන්ගේ ආශිර්වාදය හා මගපෙන්වීම යටතේ ඔැයි 2 වන ඉරු දින පස්වරු 6.00 ට රෝවිල් ඊවීනික විද්‍යාලයීය ශාලාවේදී පැවැත්වීමට නියමිතයි. (මෙල්වේ අංකය 62 1)

නිසි රස හවි සොයා පිපාසිතව දිවයන රසික දනට සුභාරංචියක් නොවේද මේ ? ඉතින් එකතුවට එදිනට විඳිනට මියැසි රස හවි ! "ගී රස ගංගා" වට අපගේ සුබපැතුම්.

සන්නස